# ආත්ම සංකල්පයේ ප්‍රභවය හා ස්ථාපනය පිළිබඳ විමසා බැලීමක්

ආනන්ද විජේරත්න

Man is inquisitive as to what would happen to him after death since death is universal. It was clear the majority of people believed that death was not the end of life. As a result, discussions about the existence of after life continued for centuries, all over the world, and different conclusions were made.

The scope of this article is not to discuss the concept of *a:tman* extensively but to examine how the idea of after life evolved in various communities upto the concept of an eternal soul and the background that led to these conclusions.

ප්‍රාථමික යුගයෙහි මිනිසා සොබාදහම ඇසුරු කොට ගනිමින් තමාගේ එදිනෙදා ජීවිතය සකසා ගත්තේය. මේ සඳහා හෙතෙම සොබාදහම අවබෝධ කර ගැනීමෙහි ලා උනන්දු විය. මෙහි දී මිනිසාගේ අවධානයට යොමු වූ වැදගත් ප්‍රධාන ලක්ෂණය වූයේ සොබාදහමෙහි ක්‍රියාකාරීත්වයයි. හිරු-සඳු, ගංගා-මුහුදු, සුළඟ-ගස්වැල් ආදී සොබාදහමෙහි විවිධ අංගයන් තුළ ද මිනිසාගේ ක්‍රියාකාරීත්වයට සමාන වූ ක්‍රියාකාරීත්වයක් පවත්නා බව ආදි මිනිසාට පැහැදිලි විය. මිනිසා තුළ පමණක් නොව සතුන් හා ගස්වැල් ආදියෙහි ද අභ්‍යන්තරයෙහි පවත්නා ජීවයක් ඇත යන අදහස මෙයින් තහවුරු විය. ජීවවාදය පිළිබඳ වූ මෙම අදහස පසුව තවදුරටත් වර්ධනය වූයේය.[1]

සප්‍රාණිකත්වය ප්‍රකට වන ජීවීන් හා වෘක්ෂලතාදිය හැරුණු විට හිරු-සඳු, සුළඟ, ගංගා-මුහුදු, පර්වත යනාදී සොබාදහමෙහි අප්‍රාණිකයයි සැලකෙන වස්තූන් හා ද්‍රව්‍යයන්හි අන්තර්ගත වූ කිසියම් ක්‍රියා ශක්තියක් පිළිබඳව ද මිනිසා අවබෝධ කොට ගෙන සිටියේය. මෙම පදනම යටතේ පූර්වෝක්ත ද්‍රව්‍යයන් තුළ කිසියම්

---

© ආනන්ද විජේරත්න
කදුරුගමුවේ නාගිත හිමි, මැණික් ගුණසේකර, නිමල් පරණතල, උපුල් රංජිත් හේවාවිතානගමගේ සංස්., 1999, මානව ශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, කැලණිය විශ්වවිද්‍යාලය.